මව්බිම - 0204 07

# රනිල් - දේශපාලනය වෙනුවට කූටෝපාය

සුනන්ද දේශප්‍රිය

තමා නායකත්වය දෙන පක්ෂයේ පල්ල කඩාගෙන යද්දී රනිල් වික්‍රමසිංහ නේපාලයේ දේශපාලනඥයින් සමඟ සුහද පිළිසඳරෙහි යෙදෙමින් සිටියේ ය. රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් හෝ වෙනත් අන්දමකින් හෝ මෙම අවස්ථාවෙහි නේපාල සංචාරයක කිසිදු වැදගත් කමක් නැත. නමුත් සිය පක්ෂය මහත් අර්බුදයකට මුහුණ දී සිටින බව දැනදැනම ඒ මහතා කත්මන්ඩු නුවරට පියෑඹිය.

වර්ධනය වෙමින් පැවැති කැරැල්ල නවතා ගැනීම පිණිස ඔහු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සමඟ මෙන්ම කැරැලි කණ්ඩායමේ නායක කරු ජයසූරිය මහතා සමඟ ද අසාර්ථක වූ සාකච්ඡා දෙකක් පැවැත් වීය. ඉන් පෙනී ගියේ තත්ත්වය එතරම් හොඳ නැති බව රනිල් වික්‍රමසිංහ දැන සිටි බව යි.

එජාප ආණ්ඩුවක් සඳහා ජනවරම ලබා ගත් මංත්‍රිවරු දුසිම් දෙකකට වැඩි පිරිසක් දැන් මහින්ද චින්තනය යටතේ සේවය කරති. කලින් එජාප මංත්‍රීවරු ආණ්ඩුවට එක් වූයේ තනි තනියම ය. කරු සමඟ එජාප තරු රැසක්ම දැන් ආණ්ඩුවට එක්ව සිටිති.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සමඟ හවුල්වීම සඳහා කරු ජයසූරිය- ජී.එල්. පීරිස් කණ්ඩායම උනන්දු වූයේ කලක සිට ය. එම හවුල් වීම පිනිස සහ එය සාධාරණ කිරීම සඳහා එම කණ්ඩායම සිය කොන්දේසි අඩංගු එක්තරා ආකාරයක ප්‍රතිසංස්කරණ ලියැවිල්ලක් පාක්ෂික බුද්ධිමතුන්ගේ දායකත්වය ද ඇතිව සකස් කළහ. එම ලියැවිල්ල රනිල් වික්‍රමසිංහ මහතාටද රහසක් වූයේ නැත.

එම ලියැවිල්ලෙහි තිබූ එක් ප්‍රධාන කරුණක් වූයේ රාජ්‍ය ආයතන ස්වාධීන කිරීම සඳහා වූ 17වන සංසෝධනය ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යි. එම ලියවිල්ල එජාපයෙන් බිදී ගොස් ආණ්ඩුවට එකතු වීමට වඩා පක්ෂ දෙක අතර එකඟතාවයක් සඳහා වූ ප්‍රයත්නයක් විය.

නමුත් එම අවශ්‍යතාවය වටහා ගෙන එය රටේ සහ පක්ෂයේ යහපතට යොදවීමට රනිල් වික්‍රමසිංහ කිසිදු උනන්දුවක් හෝ නිපුනතාවයක් දැක්වූයේ නැත. එම ලියැවිල්ල ශක්තිමත් කොට රටේ ජනයාගේ යහපත පිනිස යහපාලනය සහ සාමය ගොඩනැගීමේ ඒකාබද්ද වැඩ සටහනක් බවට පෙරලීමට ඔහු උත්සාහ කලේ නැත.

ඔහුගේ දේශපාලන කල් ක්‍රියාව තේරුම් ගැනීමට බැරි තරම් නිද්‍රාශීලී සහ නිෂේධාත්මක විය. දේශපාලන බලවේග සමඟ ප්‍රජාතන්ත්‍රීයව සහ විවෘතව කටයුතු කිරීම වෙනුවට ඔහු කැමැත්තක් දක්වන්නේ උපාමාරු මගින් සිය අරමුණු කරා යෑමට ය. එම උපාමාරු බොහෝ දුරටම කූටෝපා මිස දේශපාලන මූලෝපායන් නොවේ.

හරියට 2003 දෙසැම්බරයේ දී ජනාධිපතිනි කුමාරතුංග රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ අමාත්‍යාශ තුනක් පවරා ගෙන සහජීවී ආණ්ඩුවක් සඳහා ඉදිරිපත් කළ අවස්ථාව අල්ලා ගැනීමට අසමත් වූ පරිදිම ය. එම අවස්ථාවේ දී මහා මැතිවරණයක් ඉල්ලා

මතුපිට උද්ඝෝෂණයක් ගෙන ගිය නමුත් වික්‍රමසිංහ මහතා උත්සාහ කලේ ඉන්දීය ආණ්ඩුවේ බලපෑම් මගින් සිය අගමැති ධුරය රැක ගැනීමට ය. දේශපාලන බලතුලනය තේරුම් ගත්තේ නම් ඒ අවස්ථාවේ ඔහු කළ යුතු වූයේ සාමය සහ යහ පාලනය සඳහා සහජීවී ආණ්ඩුවකට කැමැති වීම ය.

නමුත් 2002 සිය පක්ෂයට ආණ්ඩු බලය ලැබුණු අවස්ථාවේ සිටම ඔහු අමාත්‍ය මංඩලයේ සිටි සිය  දේශපාලන හිතවාදීන් ලවා ජනාධිපතිනි කුමාරතුංගට පහර ගැසීම ආරම්භ කළේ ය. නමුත් එම කිසිදු චෝදනාවක් නීතිය මගින් තහවුරු කිරීමට කටයුතු කළේ ද නැත. එම උපාය මාර්ගයේ අරමුණු වුයේ ජනාධිපතිනි කුමාරතුංග බිය ගන්වා සිය පාලනය ගෙන යාමට ය. ඒ ද දේශපාලනය වෙනුවට කූටෝපායේ සහාය පැතීමකි.

මහින්ද රාජපක්ෂ  ජවිපෙ සමඟ ඇති කරගත් දේශපාලන එකඟතාවයන් අර්බුදයට යන බව කල් ඇතිව දැකීමට අත්දැකීම් සහිත දේශපාලනඥයකුට එතරම් දුෂ්කර නොවිය යුතුව තිබුණි. ඇත්ත වශයෙන්ම නම් ජනාධිපති මැතිවරණ සමයේ දීම පවා මහින්ද රාජපක්ෂ මහතා ඒ බව අඟවා තිබුනි. දුර දක්නා නුවනින් යුතු දේශපාලනඥයකු කළ යුතු වූයේ එම තත්ත්වයට මුහුන දිය හැකි වඩාත්ම දේශපාලන වශයෙන් යහපත් තෝරා ගැනීම කල්පනාවට ගැනීම යි.

එම තත්ත්වය යටතේ එජාප ප්‍රතිසංස්කරනවාදී පිරිස් එජාපය වශයෙන් ආණ්ඩුවට එක්වී කැබිනට් ඇමැතිධුර ගැනීමට සකස්කල වැඩ සටහන බිඳ දැමීම පිනිස ඔහු කලේ විවෘත සාකච්ජාවක් නොව එම වැඩ සටහන එකවරම තමාගේ බවට පත්කර ගැනීම ය. ඔවුන් සකස්කල ලියැවිල්ලට රනිල් වික්‍රමසිංහ අත්සන් කලේ එමගින් එම පිරිස පක්ෂය තුල පරාජය කර සිය බලය පෙන්වීමට ය. එය ද මතුපිට දේශපාලනයක් නොවේ. උපාමාරු දැමීමකි.

යහපාලනය හෝ සාමය ඇති කිරීම සඳහා ආණ්ඩුව සමඟ හවිල් වීම ඔහුගේ අභිප්‍රාය නොවීය. අවබෝධතා ගිවිසුම අත්සන් කලද එය ඉදිරියට ගෙන යෑමට ඔහු උනන්දුවක් දැක්වූයේ ද නැත. පක්ෂය තුළ සිය නායතක්වය රැඳවා ගැනීම මිස අන් අරමුණක් ඔහු මේතාක් පෙන්වා නැත.

ජනාධිපතිවරනයෙන් ලද පරාජය පක්ෂයේ නායකත්වයෙන් ඉවත්විමට බල කැරෙන ව්‍යාපාරයක් බවට පත්වීමට තිබූ අවස්ථාව ඔහු මඟ හැරියේ තමා නායකත්වයෙන් ඉවත් වීමට යන බවට කතාවක් ප්‍රචාරය කිරීමෙනි. ජනාධිපතිවරණ පරාජය සිය නායකත්වය සහ ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කිරීමක් බව පිලිගැනීමට ඔහු මැලි විය. ඇත්ත වශයෙන්ම නම් ඒ පිළිබඳ කිසිදු ගැඹුරු සාකච්ජාවකට ඔහු මුල පිරුවේ නැත.

පක්ෂයේ සිය නායකත්වය තහවුරු කර ගැනීමට ඔහු කලේ විදෙස් සංචාරන්හි යෙදෙමින් රට රටවල නායකයින් මුණ ගැසීම ය. එය ද දේශපාලන බලවේග සමඟ කටයුතු කිරීමක් නොව උපාමාරු නොහොත් යළිත් වරක් කූටෝපා මත රැදා සිටීමකි.

පක්ෂය තුළ ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය බවට නැගී ආ ප්‍රවණතාවයට රනිල් වික්‍රමසිංහ මුහුණ දුන්නේ ද කූටොපා මගිනි. තමාට හිතවක් වජිර අබේවර්ධන වැනි පිරිස් ලවා ප්‍රතිසංසංකරණවාදී පිරිස් වෙත ප්‍රහාර එල්ල කලේය. ප්‍රතිසංස්කරණ සියල්ල ක්‍රියාත්මක කිරීමට විධායක කමිටු රුැස්වීමේ දී එකඟ වී නගර සභා පිටියට පුළුල් රැස්වීමක් කැදවා ප්‍රතිසංස්කරණවාදී පිරිස් තනි කිරීමට උත්සාහ ගත්තේ ය. කරු ජයසූරිය නියෝජ්‍ය නායක කමින් පහළට ඇද දැම්මේ ය.

2002 - 2004 රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ වැදගත්ම කාර්යය ලෙස සටහන් වන සටන් විරාම ගිවිසුම සහ සාම සාකච්ඡා තුළද ඔහු බලාපොරොත්තු තැබුවේ මහජන මතය ගොඩ නැගීම කෙරෙහි නොවේ. උපාමාරු සහ කූටෝපා කෙරෙහි ය. දෙමළ ජනයා යුදවාදී බලවේග කෙරෙන් මුදා ගැනීමට ඔහුන්ගේ සාධාරණ ප්‍රශ්න විසදීම වෙනුවට සංගීත සංදර්ශන සහ චිත්‍රපට ශාලා යොදා ගැනීමට ඔහු උත්සාහ කලේ ය. කිසිදු වාරණයකින් තොරව ඕනෑම චිත්‍රපටයක් උතුරට යවන්නැයි කියා සිටියේ ය.

සටන් විරාම ගිවිසුම පිලිබදව මහාජනයා අතර අවබෝධයක් ඇති කිරීමට උනන්ද වූයේ නැත. සුදු නෙලුම් හෝ තවලම වැනි සාම ව්‍යාපාර කෙරෙහි ඔහු විශ්වාසය තැබුවේ නැත. අවශ්‍ය වූ විට දැවැන්ත ප්‍රචාරයකින් කපටි ලෙස සිය මතය ජය ගැන්විය හැකි යැයි යන අදහස අද මෙන්ම එදා ද රනිල් වික්‍රමසිංහ දේශපාලන අදහස විය.

ඔහුගේ දේශපාලනය තුළ මහා ජනයා නැත. එබැවින් දේශපාලන අවබෝධය සඳහා කැරෙන ව්‍යාපාර නැත. පෙනෙනවිධියට ඔහුගේ චින්තනය තුල පක්ෂයක් ද නැත. ඇත්තේ අන්තේවාසික තරුණ පිරිසක් පමණි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සාකච්ජාවක් නැත.

මහජනයා අරභයා වුව පක්ෂය අරභයා වුව ඔහු විශ්වාසය තබන්නේ ප්‍රචාරක මෙන්ම ආයතනික උපාමාරු සහ කූටෝපා මත ය.

කුමාරතුංග දේශපාලනයට මෙන්ම රාජපක්ෂ දේශපාලනයට ද මුහුණ දීමට වික්‍රමසිංහ මතවාදය අසමත් වූ සහ වන එක් ප්‍රධාන සාධකයක් වනුයේ මෙම ප්‍රභූවාදී සහ කුමන්ත්‍රණවාදී ප්‍රවිශ්ධය යි.

නිමි